GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

13.08.2014

## මාධ්‍ය නිවේදනයයි.

**වෛද්‍යවරු සඳහා දෙමළ සිංහල භාෂා පුහුණු පාඨමාලාව.**

වෛද්‍යවරුන්ගේ දෙමළ සිංහල භාෂා පුහුණුව නැවත ඇරඹේ. රෝගීන්ට තමන්ගේ භාෂාවෙන්ම වෛද්‍යවරයා අමතන්නේ නම් ඔවුන්ට එය විශේෂ විශ්වාසයක් ගෙන දෙන කාරණයක් වන අතර වෛද්‍යවරයා සහ රෝගියා අතර සම්බන්දය ප්‍රසන්න කිරීමටද ඉවහල් වේ. එතුලින් වෛද්‍යවරයාටද ඉහළ තෘප්තියක් ලැබේ. එමෙන්ම සෞඛ්‍ය සේවාවේ කාර්යයක්ෂමභාවයද ඉහළයයි.

මෙවන් අවස්ථාවලදී විදේශ රටවල වෛද්‍යවරුන් සාමන්‍යයෙන් කරන්නේ භාෂා පරිවර්තකයෙකුගේ සේවය ලබා ගැනිමයි. එය සෞඛ්‍ය සේවාවේ වියදම අධික විමටද කාරණාවකි. එහෙයින් අප සංගමය ආරම්භ කල භාෂා පුහුණු වැඩසටහන නිසා කාර්යයක්ෂමභාවය හා ගුණාත්මක බව වැඩිවෙනවා පමණක් නොව සෞඛ්‍ය සේවාවේ වියදමද අඩු වනු ඇත. පසුගිය වසරේ ආරම්භ කල වෛද්‍යවරුන්ගේ භාෂා පුහුණුවේ වැඩ පිළිවෙල ඉතා සාර්ථකව ක්‍රියාත්මකවෙමින් මේවන විට කනිෂ්ඨ වෛද්‍යවරු 2000ක් පමණ පුහුණු කර ඇත. ද්‍රවිඩ රෝගීන්ට ඉතා චතුර ලෙස සිංහල කනිෂ්ඨ වෛද්‍යවරු රෝගී විස්තර පිළිබඳ සංවාදයේ යෙදෙන අයුරු ඊට මැණවින් සාක්ෂි දරයි. රෝගියාගේ තෘප්තිමත් භාවය ඉතා ඉහළ මට්ටමකට ගෙන යන මෙම වැඩ පිළිවෙල ආරම්භ කිරීම සඳහා අපට සහයෝගය ලබා දුන් රාජ්‍ය භාෂා අමාත්‍යංශයත්, සෞඛ්‍ය අමාත්‍යංශයත්, කැබිනට් මණ්ඩලයේ ලේකම්, සුමිත් අබේසිංහ මහතාත් අප කෘතවේදිව සිහිපත් කරමු.

පසුගිය මාස 2ක තුල අප සංගමය අකර්මන්‍ය වීම නිසා මෙම පුහුණු වැඩ සටහන අඩාල විය. නමුත් අප මේ සතියේ සිට එම වැඩසටහන නැවත ආරම්භ කරනු ඇත. එතුලින් භාෂා පරිවර්ථකයන්ගෙන් යැපෙන ලොව අනෙකුත් රටවල් වල වෛද්‍යවරුන්ටද අප ආදර්ශයක් ලබාදෙන බව දන්වමු.

ස්තුතියි

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

වැඩිදුර විස්තර:

| | |
|---|---|
| වෛද්‍ය සමන්ත ආනන්ද | 0777666301 |
| වෛද්‍ය නවීන්ද සොයිසා | 0718582444 |